
# බලු පැටියා



අමීලියා ලුම්බිණී රාජපක්ෂ

# බලු පැටියා

අමීලියා ලුම්බිණී රාජපක්ෂ

මහාමායා බාලිකා විද්‍යාලය

2 වන ශ්‍රේණිය A

මුද්‍රිත දිනය 2025.02.02

අනෙත් කෘතිය

අමීලියා ලුම්බිණී රාජපක්ෂ

යාළු පොඩිත්තෝ

ISBN 978-624-208-085-7

# පිදුම

මේ පොත් පිංච රචනා කිරීමට මඟ විවර කර දුන් මහාමායාවේ ගරු විදුහල්පතිතුමාටත් ගුරු මවුපියන්ටත් නිතැතින් මා වෙනුවෙන් වෙහෙසෙන මාගේ ආදරණීය දෙමාපියන්ටත් අත්තම්මාටත් සහෝදර සහෝදරියන් ඔබ සැමටත් මෙම කෘතිය සාර්ථක කර ගැනීමට නන් අයුරින් උපකාර කළ සියලු දෙනාටත් ඉතා ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණිය යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම ඊට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනඟා ඒ රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනය සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

අහස කළු කළා. සුළඟක් හැමුවා. ලොකු වැස්සක් වැස්සා.



පාසැල ඇරිලා මම එළියට ආවා.ඒත්,ලොකු වැස්සක් වහිනවා.මම කුඩය ඉහළාගෙන ගෙදර ආවා.



ගෙදර එනකොට පාර දෙපැත්තේ වතුර පිරිලා කාණු උතුරලා ගලාගෙන යනවා. පාරටත් වතුර දාලා කුණු රොඩු පාර පුරාම තිබුණා.



සුළං තද නිසා වැවට ගසකුත් කඩාගෙන වැටිලා. තද සුළඟ නිසා හරිම සීතලයි.



මම දැක්කා පුංචි බලු පැටියෙක් තෙමිලා,පාරේ වෙවුල වෙවුලා ඉන්නවා.වතුරට ගහගෙන ඇවිත් වගේ.



මම ඉක්මනින් බලු පැටියාව වඩා ගත්තා.බලු පැටියා බයට කෑ ගහන්න පටන් ගත්තා.මම ආදරයෙන් ඔළුව අතගෑවා.




ඉක්මනට ගෙදර අරගෙන දිව්වා. අම්මාත් මමත් එකතුවෙලා බලු පැටියාගේ මඩ සේදුවා.



ඇඟ හොඳින් පිහදාලා චූටි පැටියාට කිරි හදා බොන්න දුන්නා.



චූටි පැටියාව රෙද්දකින් ඔතලා පෙට්ටියකින් තිබ්බා.



දැන් වැස්ස පායලා ඉර පායලා අව්ව හොඳට තිබුණා. මම බලු පැටියාව අව්වට අරගෙන ගිහින් ඇඟ රත් වෙන්න අව්වෙන් තිබ්බා.



චූටි බලු පැටියා පෙට්ටියෙන් බැහැලා සෙල්ලම් කරනවා. මට හරිම සතුටුයි. මම එයාට බොනි කියලා නම තැබුවා.



අපි හැමෝම සතුන්ට ආදරය කරමු.



# ස්තූතිය

මෙම පොත් පිංච සෑදීමට මා හට උපදෙස් හා උදව් උපකාර කළ ගුරු විදුහල්පතිතුමිය ඇතුළු ගුරු මවුපියවරුන්ටත් මාගේ දෙමාපියන් ඇතුළු සියලු දෙනා හට ස්තූතිය පුද කරමි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනය ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් හැකියාවන් ඔපනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘති යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනය ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසය එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලය විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක් වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැක.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාතවේ. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගැලපෙමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින්එයට පිවිසී පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-158-8

BAR COD 9 786242 081588